**පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය - 2014**

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

ආයතනය 2011 වර්ෂයේ සිට අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් සමුච්චිත අලාභයේ වැඩිවීමක් හා ශුද්ධ වත්කම් වල අඩුවීමක් පහත විස්තර අනුව පෙන්නුම් කෙරේ. මේ අනුව රාජ්‍ය මූල්‍ය අනුග්‍රහයක් නොලබා තවදුරටත් පවත්වාගෙන යාම ප්‍රශ්නකාරී බව පෙනීයයි.

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| අලාභය | (7,480,881) | (4,893,838) | (16,567,327) | (17,488,986) |
| ශුද්ධ වත්කම් | 145,129,332 | 131,597,734 | 115,225,967 | 100,231,803 |

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ණය පදනම මත ලබාගත් රු. 47,395,575 ක පර්යේෂණාගාර උපකරණ වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂය තුල සිදුකරන ලද ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් රු.4,498,267ක් අතීතානුයෝගීව ගැලපීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.70,401,000 ක් ගිණුම්ගත කර නොතිබූ අතර එම වර්ෂය අවසානයේ බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් ලැබීම් ලෙස දක්වා තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ශේෂය රු.539,540ක් වූ අතර ණයගැති උප ලේඛන අනුව එය රු. 482,917ක් වූ බැවින් රු.56,623ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දේශන ශාලා ගාස්තු ආදායම් රු.442,850 ක් මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශයේ දක්වා තිබුණු නමුත් ඊට අදාල උපයෝගී ලේඛන අනුව එය රු.548,450 ක් වූ බැවින් රු.105,600 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දීර්ඝ කාලයක් තිස්සේ පැවති එකතුව රු.417,036ක් වූ හර ශේෂ 06ක් හා එකතුව රු.8,414,980 ක් වූ බැර ශේෂ 10ක් පියවීමට හෝ නිරවුල් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) මහ ඉලුප්පල්ලම කෘෂි භෝග පර්යේෂණ සංවර්ධන ආයතනයට හා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයට ණය පදනම මත ලබා දුන් ප්ලාස්ටික් ඇසුරුම් 175 ක් සඳහා අයවිය යුතු රු.93,500ක වටිනාකමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

2008 අප්‍රේල් 04 දිනැති අංක 138 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව රු.මිලියන 20 ට වැඩි ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවත් එයට පටහැනිව විද්‍යාගාර නවීකරණ ව්‍යාපෘතිය සඳහා රු.63,932,281 ක් ගෙවා තිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධිමත් අනුමැතියකින් තොරව පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ විමර්ශන හා නිරීක්ෂණ කටයුතු සඳහා කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකුට සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන වියදම් වශයෙන් අවස්ථා 10 කදී එකතුව රු. 121,000 ක් ගෙවා තිබුණු අතර එම නිලධාරියා විසින් අනාවරණය කරගන්නා ලද නිරීක්ෂණ වාර්තා කිසිවක් ආයතනයේ කළමණාකරණය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත පත්කිරීම අනුමත කර නොතිබුණු අතර අනුමත කාර්යය මණ්ඩලය තුල එවැනි තනතුරක් ස්ථාපිත කර නොතිබුණි.

(ආ) ආයතනයේ අරමුණු වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතියකින් තොරව විවිධ සුභසාධක කටයුතු වෙනුවෙන් එකතුව රු. 193,150ක වියදම් දරා තිබුණි.

(ඇ) භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගංවතුරින් සිදුවූ තොග හානි සඳහා එකතුව රු.1,007,908 ක් තොග හානි ලෙස කපා හැර තිබුණි.

(ඈ) 2014 නොවැම්බර් 21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 5/2014 හි 02 ඡේදයට පටහැනිව භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව 2014 වර්ෂයේ ප්‍රසාද දීමනා ලෙස රු. 260,010ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් රු.17,488,986ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.16,567,327ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.921,659ක පිරිහීමක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂයේ ඌනතාවය වැඩිවීම කෙරෙහි ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය රු.207,330 කින් වැඩිවීම හා ගංවතුර නිසා සිදුවූ හානි වෙනුවෙන් රු.1,007,908 ක් කපා හැරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 ආයෝජන කළමනාකරණය

2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුල ආයෝජන වශයෙන් පැවති රු.12,748,000 ක ස්ථාවර තැන්පතු මුදල් ආපසු ලබාගෙන මූලධන වත්කම් සම්පාදනය කරගෙන තිබීම මත ආයතනයේ ආයෝජන හීනවීමක් සහ ආයෝජන ආදායම් අහිමිවීමක් සිදුවී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්යයසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එළවළු හා පළතුරු ප්‍රවාහනයේදී සිදුවන පසුඅස්වනු හානිය අවමකිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ වසර 08 කට පෙර මිලදීගත් රු.3,475,042ක් වටිනා ඇසුරුම් 7,937ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බෙදා නොහැර ඉතිරිව තිබුණි.

(ආ) 2012 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභීන් සඳහා සියයට 50 ක ප්‍රතිලාභී දායකත්වය මත උපකරණ බෙදා දීමේ වැඩ සටහන යටතේ නිෂ්පාදනය කරන ලද රු.350,000ක් වටිනා ජංගම වෙළඳ කුටි 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බෙදා නොහැර ගබඩාවේ තිබුණු අතර එම උපකරණ සුදුසු ප්‍රතිලාභීන් තෝරා බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අතිරේක ආහාර භෝග වැඩසටහන යටතේ සහල් ඇතුළු අතිරේක ආහාර භෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණින් රු.4,200,000 ක් වටිනා රයිස්ක්‍රීම් යන්ත්‍ර 20 ක් ලබාගෙන තිබුණු අතර සුදුසු ප්‍රතිලාභීන් හඳුනා නොගැනීම හේතුවෙන් එම යන්ත්‍ර 2015 ජුනි 30 දින වන විටත් බෙදා නොහැර ආයතනය තුල නිශ්කාර්යව පැවතුණි.

(ඈ) ආයතනය විසින් පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම හා පර්යේෂණ යෝජනා සැකසීම හා ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකරගත හැකි පරිදි පර්යේෂණ නිලධාරී කාර්ය මණ්ඩලය, ව්‍යාප්ති කටයුතු වල නියැලි කාර්ය මණ්ඩලය හා අදාල ප්‍රතිලාභී කණ්ඩායම් යන සියළු අංශවල ඒකාබද්ධතාවය සහිතව, ක්ෂේත්‍රයට ගැලපෙන පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි වර්තමාන වෙළඳපොළ හා කෘෂිකර්ම සහ පශු අස්වනු ක්ෂේත්‍රයේ ඉල්ලුමට සරිලන පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වුවත් ආයතනය ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල ඵලදායිතාවය අවම මට්ටමක පැවතුණි.

(ඉ) පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය ආරම්භයේ සිටම විවිධ පර්යේෂණ ව්‍යාපෘති යටතේ විශාල පිරිවැයක් දරමින් නිර්මාණය කරන ලද යන්ත්‍ර සූත්‍ර 31 කින් බොහොමයක් ප්‍රදර්ශන තත්ත්වයේ පමණක් පවතින අතර එම යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණයන් වෙළඳ පොළට හඳුන්වා දී ප්‍රචලිත කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘති නිලධාරීන් 03 දෙනෙකු වෙනුවෙන් රු.1,742,236ක වැටුප්ද ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 09 ක සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන් හා අනෙකුත් කාර්යය මණ්ඩලය සඳහා රු.2,129,626 ක වැටුප්ද වශයෙන් ව්‍යාප්ති සේවා සඳහා රු. 3,871,862 ක වියදමක් දරා තිබුණද ආයතනයේ පර්යේෂණ ප්‍රතිඵල ව්‍යාප්ත කිරීමට අදාල කටයුතු සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී නොතිබුණි.

(ඊ) ආයතනයේ ක්‍රියාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්ෂේත්‍ර 6ක් යටතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන අතර එම ව්‍යාපෘතිවල පුහුණු වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.738,054 ක් වැයකර තිබුණු නමුත් සංවර්ධන ව්‍යාපෘතිවල සහල්, සහල් ආශ්‍රිත

නිෂ්පාදන හැරුණු විට අනෙකුත් ව්‍යාපෘතිවලට අදාලව ප්‍රමාණවත් දත්ත පද්ධතියක් ආයතනය විසින් නඩත්තු කර නොතිබුණි.

**4.2** අරමුදල් ඌන උපයෝජනය

එළවළු හා පළතුරු ප්‍රවාහනයේ දී සිදුවන හානිය අවම කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ ප්ලාස්ටික් ඇසුරුම් අළෙවියෙන් ලද රු.9,251,446 ක් හා වී තම්බන බැරල් අලෙවියෙන් ලද රු.4,207,384 ක් වශයෙන් එකතු වටිනාකම රු13,458,830 ක් වූ මුදලක් අදාල වැඩසටහන් ප්‍රචලිත කිරීම සඳහා භාවිතා නොකර 2015 ජුනි 30 දින වන විටත් ස්ථාවර තැන්පතු වල රඳවාගෙන තිබුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ක්‍රියාත්මක වූ නූඩ්ල්ස් නිෂ්පාදන කර්මාන්ත ශාලාවේ නූඩ්ල්ස් නිෂ්පාදන යන්ත්‍ර අපහරණයට අදාලව පත්කළ කමිටුව විසින් 2013 ජුලි 08 දින ලබා දුන් නිර්දේශයන්ට අනුව නූඩ්ල්ස් යන්ත්‍රාගාරය තුල පවතින අධික නඩත්තු වියදමක් දැරීමට සිදුවන බොයිලේරු 02ක්, වියලනයක් හා ජෙනරේටරයක් සුදුසු පරිදි අපහරණය කරන ලෙස දක්වා තිබුණි.එහෙත් එම කමිටු නිර්දේශයන් ලබා දී වසර 02 ට අධික කාලයක් ගතවී ඇතත් 2015 ජුලි 30 දින වන විටත් අදාල කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ආයතනය සතුව පවතින වටිනාකම රු. 931,453 ක් වූ වාහන 06 ක් වසර 04 සිට වසර 12කට අධික කාලයක සිට නිශ්ක්‍රීයව පවතින අතර එම වාහන අපහරණය සඳහා සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.

4.4 ආර්ථික නොවූ ගණුදෙනු

ආයතනය සතුව ධාවන තත්ත්වයේ පවතින සංචිත වාහන 08 ක් පමණක් තිබියදී කෙටිදුර ධාවනය සඳහා සමාලෝචිත වර්ෂය තුල කුලී රථ යොදවා ගැනීම වෙනුවෙන් රු.44,530ක් වියදම් කර තිබුණි

4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ආයතනයේ පරීක්ෂණාගාරය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 61,686,875 ක උපකරණ මිලදී ගැනීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4.2(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව එක් එක් උපකරණය සඳහා මිලගණන් ඉදිරිපත්කරන ලංසුකරුවන්ගේ ලංසු ඇගයීමට භාජනය කළ යුතු වුවත් උපකරණ හා සේවා වර්ග 14 ක් යටතේ ලොට් අංක 1 සහ ලොට් අංක 2 ලෙස කොටස් 2 කට ගොනුකර මිලදී ගැනීමේදී එක් එක් ලොට් යටතේ ඇති උපකරණ සියල්ල සඳහා මිලගණන් ඉදිරිපත් නොකළ ලංසු කරුවන් සාධාරණ හේතු දැක්වීමක් නොකර බැහැර කර තිබුණි.

(ආ) යන්ත්‍රෝපකරණ 10ක් මිලදී ගැනීම සඳහා වූ ලංසු ඇගැයීමේදී ටෙන්ඩර් ලියකියවිලිවල දක්වා තිබූ තාක්ෂණික පිරිවිතර 346 ක් ඇගැයීමට ලක් කළ යුතු වුවද පිරිවිතර 60 ක් පමණක් ඇගැයීම් කර තිබුණි. තවද අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුකරු ඇගයීමට ලක් කර තිබූ තාක්ෂණික පිරිවිතර ද සපුරා තිබියදී එවා සාවද්‍ය ලෙස බැහැර කර වෙනත් ලංසුකරුවෙකු වෙත ටෙන්ඩර් පිරිනැමීම හේතුවෙන් එම උපකරණ මිලදී ගැනීමේදී රු.16,607,116ක අලාභයක් සිදුවී තිබුණි.

**4.6** කාර්ය මණ්ඩල පරිපාලනය
---------------------------------

ආයතන කාර්ය මණ්ඩලය තුල අනුමත තනතුරු 02 ක් නොවූ රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු හා පෞද්ගලික සහකාර තනතුර සඳහා අනියම් පදනම මත සේවකයන් දෙදෙනෙකු බඳවාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.364,036 ක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2002 මැයි 24 දිනැති අංක PF/PE 21දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2015 ජූලි 02 දින දීය.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම
---------------------

සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මට පරිබාහිරව රු. 540,830ක් වටිනා මිලදී ගැනීම් සිදුකර තිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය
----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

> සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වියදම තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 42 සිට සියයට 187 දක්වා විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

06. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකළ අතර තවදුරටත් පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ආදායම් රැස් කිරීම
(ආ) අයවැය පාලනය
(ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය
(ඈ) පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඉ) වාහන පාලනය